**දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 14 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
-----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මාසික ඒකාබද්ධ වැය සාරාංශය අනුව ප්‍රාග්ධන වැය රු.55,075 ක් හා කැබ් රථයට අදාල ණය වාරික වූ රු.706,273 ක් සමඟ මුළු ප්‍රාග්ධන වියදම රු.761,348 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට රු.816,423 ක් ගිණුම් ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු.55,075 කින් වැඩියෙන් දැක්විණි.

(ආ) 2011 වර්ෂයේ දුන් වට්ටම් ශේෂය වියදමට හර නොකිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදල පමණක් රු.41,852 කින් බැර කර තිබුණි.

(ඇ) 2013 ජනවාරි 01 දිනට හිඟ හිටි මුද්දර ආදායම රු.7,767,897 ක් වූ අතර ඒ සඳහා රු.8,658,112 ක් ලැබී තිබීම නිසා වැඩිපුර ලැබී තිබූ රු.890,215 ක් හිඟ හිටි මුද්දර ආදායම් ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කිරීම වෙනුවට රු.4,408,112 ක් හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුම හර කර ආදායම් හා වියදම් ගිණුම බැර කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම රු.4,408,112 කින් වැඩියෙන් දැක්විණි.

(ඈ) හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුම ශේෂ කිරීමේදී එහි නිවැරදි ශේෂය රු.7,767,897 ක් වුවද, රු.3,359,785 ක් ලෙස ශේෂ කර එම ශේෂය ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.73,062 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුනු අතර ඒවා ස්ථාවර වත්කම් ලේඛනයටද ඇතුළත් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ලෙජරය අනුව සේවක ඇප ගිණුමේ ශේෂය රු.70,920 ක් වුවද, ශේෂ පත්‍රයට රු.70,820 ක් ලෙස සටහන් කර තිබුණි.

(උ) විගණිත දිනය වූ 2014 ජූලි 09 වන විටත් වැඩ ආරම්භ කර නොතිබූ ව්‍යාපෘති 2 ක් සඳහා ඇස්තමේන්තුගත වියදම වූ රු.1,000,000 ක් වියදම් ලෙස ගිණම්ගත කර ණයහිමි ප්‍රතිපාදන සළසා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම හා කර්මාන්ත ණයහිමි ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්විණි.

(ඍ) පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් ණය පදනම මත සභාවට 2013 වර්ෂයේ ලබා දී තිබූ රු.3,178,456 ක් වූ කැබ් රථයේ වටිනාකම ණය ගිණුමට ගිණුම් ගත කිරීම හා එහි වාරික ගෙවීම් රු.706,272 ක් ප්‍රාග්ධන ගත කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.96,307,863 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැක විය.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,569,580 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,626,457 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) | වරිපනම් හා බදු | 3,640 | 1,939 | 7,557 |
| (ii.) | බදු කුලී | 241 | 141 | 176 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 123 | 123 | 116 |

2:2:2 වරිපනම් බදු

--------------

2013 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.5,718,634 ක් වූ අතර ඉන් රු.3,378,122 ක් වර්ෂ 5 කට වඩා පැරණි ශේෂ වූ අතර රු.1,998,958 ක් වර්ෂ 1 ත් 5 ත් අතර කාලයකට අදාල විය. 2014 ජූලි 30 වන විට ඉන් රු.669,596 ක් පමණක් අය කර ගෙන තිබුණි.

2:2:3 අක්කර බදු

------------

2013 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.1,335,234 ක් වූ අතර ඒ තුළ වර්ෂ 5 කට වැඩි රු.1,317,549 ක ශේෂයක් විය. 2014 ජූලි 30 වන විට හිඟ ශේෂයෙන් රු.36,381 ක් පමණක් අයවී තිබුණි.

2:2:4 කර්මාන්ත හා ව්‍යාපාර බදු

-----------------------------

2013 දෙසැම්බර් 31 දිනට හිඟ ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු ශේෂය පිළිවෙලින් රු.402,390 ක් හා රු.100,500 ක් වූ අතර ඒ තුළ වර්ෂ 5 කට වැඩි රු.198,580 ක් හා රු.39,200 ක් පවතින අතර විගණිත දිනය වූ 2014 මැයි 30 වන විටත් අයකර ගෙන තිබුණේ රු.48,200 ක් හා රු.8,250 ක් පමණි.

2:2:5 කඩකුලී

-----------

(අ) 2013 දෙසැම්බර් 31 දින වන විට රු.101,500 ක හිඟ කඩ කුලී ශේෂයක් පවතින අතර මේ තුළ වර්ෂ 5 කට වැඩි රු.24,750 ක්ද, වර්ෂ 1 ත් 5 ත් අතර රු.37,912 ක්ද පවතින නමුත් 2014 මැයි 30 දින වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අංක 06, 128 හා 129 දරන කඩකාමරවල ගිවිසුම් අළුත් කිරීමද සිදු කර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 12,816,478 |
| (ii) | මුද්දර ගාස්තු | 3,359,785 |

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකර්යක්ෂමතා

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>**අත්තිකාරම් ගෙවීම**</u>

1981 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවත එන රු.173,523 ක් වූ අත්තිකාරම් ශේෂය විගණිත දිනය වූ 2014 ජූලි 10 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>**බැංකු සැසඳුම්**</u>

2013 දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබූ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.119,900 ක් වූ චෙක්පත් 5 ක් සම්බන්ධයෙන් 2014 මැයි 30 දින වන විටද ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) <u>**කල් ඉකුත් වූ තැන්පතු**</u>

වර්ෂ 2 කට වඩා කල් ඉකුත් වූ රු.1,382,108 ක් වූ තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) <u>වාහන අනතුරු</u>

සභාවට අයත් කැබ්රථයක් 2013 අප්‍රේල් 26 වන දිනද, ට්‍රැක්ටරයක් 2013 පෙබරවාරි 27 දිනද අනතුරුවලට ලක්ව තිබූ අතර එම අනතුරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 102, 103 හා 104 නියමයන් අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) <u>සංයුක්ත සැළැස්ම</u>

ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකරගැනීම සඳහා වර්ෂ 3 කට නොඅඩු කාලයක් සඳහා වූ සංයුකත සැළැස්මක් සකස් කර නොතිබුණි.

(ඊ) <u>ප්‍රසම්පාදන සැළැස්ම</u>

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.2 <u>වත්කම් කළමනාකරණය</u>

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 756 අනුව සැම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු වුවත් 2013 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ 2014 මැයි 30 දින වන විටත් සිදු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 1647(ආ) ප්‍රකාරව සභාව සතුව පවත්නා වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවත් එවැනි සමීක්ෂණයක් වාර්ෂිකව සිදු කර නොතිබුණි.

(ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පවත්වාගෙන යායුතු පරිගනක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

3.3 <u>අභ්‍යන්තර විගණනය</u>

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 128, 132, 134 සහ පළාත් පාලන කොමසාරිස්ගේ අංක WP/LGD/10/2008 හා 2008 අගෝස්තු 19 දිනැති චක්‍රලේඛයෙහි උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) අයවැයකරණය
(iii) ආදායම් පරිපාලනය
(iv) තොග පාලනය
(v) ව්‍යාපෘති පරිපාලනය